ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)ගෞරව උපාධි වැඩසටහන 2020/2021

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021

SNU5341/ ESU3141- අධ්‍යාපන උපදේශනය හා මාර්ගෝපදේශය

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.08 වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ‘උපදේශනය සායනික ක්‍රියාවලියක් ලෙස සැලකේ.’

    සේවාලාභීන් මුහුණ දෙන මනෝ විද්‍යාත්මක හා චර්යා ගැටළුවලට ප්‍රතිකාර කිරීමට භාවිතයට ගත හැකි ප්‍රතිකාරාත්මක ශිල්ප ක්‍රම තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. උපදේශනය තුළින් කළමනාකරණය කරගත හැකි/මඟහරවා ගත හැකි විශේෂ අවශ්‍යතා සහිත යෞවනයන් මුහුණ දෙන ගැටළු පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ‘අසමත් වීමේ චක්‍රය’ උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

04. සමෝධානික සංවිධාන ව්‍යුහය යටතේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා උපදේශනය හා මාර්ගෝපදේශ සැපයීමේ වාසි තුනක් (03) පරීක්ෂා කරන්න.

05. උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ දැනුම භාවිත කිරීම විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමඟ කටයුතු කරන ගුරුවරුන්ට වැදගත් වන්නේ මන්දැයි හේතු හතරක් (04) ආශ්‍රයෙන් ලියා දක්වන්න.

06. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් මුහුණ දෙන ‘ජීවන ක්ලමථය’ යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? සුදුසු උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

07. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ වෘත්තීය සංක්‍රමණ ක්‍රියාවලිය තුළ පාසල් උපදේශන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය සම්බන්ධීකාරක ආයතනයක් ලෙස කටයුතු කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ උපදේශන හා මාර්ගෝපදේශනය සපයන සංවිධාන තුනක් (03) ලැයිස්තු ගත කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (I) පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශයේ මූලික දර්ශනය කුමක් ද? (ලකුණු 10)

(II) 'උපදේශනයේ ප්‍රතිකාරාත්මක ක්‍රියාවලිය තුළ උපදේශකවරයා හා සේවාලාභියා අතර ප්‍රතිකාරාත්මක සම්බන්ධතාවයක් පැවතීම අතිශයින් වැදගත් වේ.'

උක්ත ප්‍රකාශය පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශයට අනුව සනාථ කරන්න. (ලකුණු 10)

10. 'පන්ති කාමරය තුළ නිහඬ (Mute) චර්යා දක්වන ළමයින් සිටිය හැකි ය.' ළමයෙකු පෙන්වන නිහඬ චර්යාවකට බලපෑ හැකි හේතු හෙළිදරව් කිරීමට ඔබට සිදුවූයේ යැයි සිතන්න.

I) උක්ත දක්වන ලද ළමයා අධ්‍යයනයේ දී ඔබට භාවිත කළ හැකි උපදේශන ශිල්ප ක්‍රම මොනවා ද? (ලකුණු 10)

II) උක්ත දක්වන ලද ළමයාගේ අදාළ චර්යාව අවම කිරීමට ඔබට යොදා ගත හැකි උපාය මාර්ග මොනවා ද? (ලකුණු 10)

11. 'බොහෝ ගුරුවරුන්ට ඉගෙනුම් දුබලතා ඉගෙනුම් දුෂ්කරතාවයෙන් වෙන් කොට හඳුනා ගැනීමට නොහැකි ය.'

I) ළමයින් අත්දකින ඉගෙනුම් දුෂ්කරතා හෝ ඉගෙනුම් දුබලතා සඳහා හඳුනා ගැනීමේ සහ මැදිහත් වීමේ වැඩ සටහනක් සැලසුම් කිරීමට ඔබට සිදු වූයේ යැයි සිතන්න.

එම සුවිශේෂී ක්‍රියාකාරකම ඔබ සැලසුම් කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

II) ඉගෙනුම් දුෂ්කරතාවය හා ඉගෙනුම් දුබලතාවය අතර වෙනස්කම් පිළිබඳ ඔබ ගුරුවරුන් දැනුවත් කරන්නේ කෙසේ ද? (ලකුණු 10)

12. I) සමායෝගී ගැටලු යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 06)

II) 'සමහර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් සමායෝගි ගැටළු අත් දැකීමට ඉඩ ඇත.'

විශේෂ අවශ්‍යතා සහිත ළමයින් අත්දකින සමායෝගී ගැටළු සඳහා බලපෑ හැකි සාධක තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III) විශේෂ අවශ්‍යතා සහිත ළමයින් තුළ ඇති සමායෝගී ගැටළු අවම කිරීමට ගත හැකි ප්‍රතිකාරාත්මක ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 08)

13. I) පහත දැක්වෙන අංශ යටතේ සුභග ළමයින් පෙන්වන ගති ලක්ෂණ මොනවා ද?

අ) භාෂාව හා ඉගෙනීම

ආ) මනෝචාලක සංවර්ධනය හා ඉගෙනීම

ඇ) පෞද්ගලික හා සමාජ ගති ලක්ෂණ (ලකුණු 10)

II) ඔබ සුභග හා සහජ දක්ෂතා සහිත සිසුන්ට සාමාන්‍ය පන්ති කාමරය තුළ සහය වන්නේ කෙසේ ද? (ලකුණු 10)

14. 'බොහෝ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ට පාසලින් වැඩ ලෝකයට සංක්‍රමණය වීමේ දී අමතර සහයක් අවශ්‍ය වනු ඇත.'

I) ඔවුන්ට එවන් අමතර සහයක් අවශ්‍ය වන්නේ මන්ද? සුදුසු උදාහරණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

II) වෘත්තීය උපදේශය තුළ ළමයින් තක්සේරු කිරීම සඳහා සමහර තක්සේරුකරණ ඉන්වෙන්ටරි සහ ප්‍රමිථ පරීක්ෂණ තිබේ. වෘත්තීය උපදේශනය තුළ සිදු කරන එවන් තක්සේරුකරණයන්ට අදාළ පරමාර්ථ තුනක් **(03)** දක්වන්න. (ලකුණු 06)

III) ඔබ විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට මනා වෘත්තීය සංක්‍රමණයක් සඳහා පහසුකම් සලසන්නේ කෙසේ ද? (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.